පොදු විසර්ජන ගිණුම් තුන පිළිබඳ අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන - 2014
--------------------------------------------------------------------------------------------

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 3008 එස් ආර්අයි සාමාන්‍ය මෙහෙයුම් හා අංක 3009 එස්ආර්අයි විශේෂ මෙහෙයුම් ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවෙහි 4.04 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ණය ගිවිසුම අනුව අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව වැඩසටහනේ කටයුතු ජාතික මට්ටමෙන්ද, පළාත් සභා මගින් පළාත් මට්ටමෙන්ද කරගෙන යාමට අපේක්ෂිතය. මෙම වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ජාතික මට්ටමෙන් කරන ලද වැඩ කටයුතු පිළිබඳ අදහස් දැක්වීම් වලින් සමන්විතය.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණ, අරමුදල් සම්පාදනය සහ කාලපරිච්ඡේදය

------------------------------------------------------------------------------------

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, රටේ සාමාන්‍ය අධ්‍යාපන අංශය මුහුණපාන අභියෝග ජය ගැනීම පිණිස අවශ්‍ය මූල්‍යමය සහාය ලබාදීම සඳහා 2013 – 2017 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. අධ්‍යාපන ආංශික වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය අධ්‍යාපන අමාත්‍යාංශය වේ. අධ්‍යාපනික ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහනට අනුව, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ලබාගැනීමේ සමාන අවස්ථා ඉහළ නැංවීම, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා අධ්‍යාපන කටයුතු පාලනය හා සේවා සැපයුම් ශක්තිමත් කිරීම වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩොලර් මිලියන 200 ක් වේ. වැඩසටහනේ කටයුතු 2013 අගෝස්තු 23 දින ආරම්භ කර 2018 අගෝස්තු 31 දින වන විට අවසන් කිරීමට නියමිතය.

1.3 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------------

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ

තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිත අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව, උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමට අවශ්‍ය යැයි සලකනු ලබන පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන කළමනාකරණයෙහිලා සතුටුදායක පාලනයක් සහ වැඩසටහනෙහි මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය කලමනාකරණ වාර්තා, වැඩසටහන මගින් පවත්වාගෙන ගොස් තිබුණු උසස් මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සැසඳීම් කර තිබුණේද යන බව

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිත ආයතනයෙන් ලැබුණු අරමුදල් වලින් වැඩසටහන වෙනුවෙන් වූ අධ්‍යාපන අංශයෙහි මධ්‍යගත ආයතන තුනෙහි වියදම්, මූල්‍ය සහ භෞතික වශයෙන් වැඩසටහනෙහි ප්‍රගතිය, වැඩසටහනෙහි මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වීම පිණිස අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබුවේද යන වග

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුම්වල නියමකර ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ වැඩසටහනෙහි අරමුණු සඳහා අධ්‍යාපන අංශ මධ්‍යගත ආයතන තුන මගින් උපයෝජනය කර තිබුණේද යන බව

(ඊ) මුදල් රෙගුලාසි අංක 150 හා අංක 239/2014 හා 2014 දෙසැම්බර් 01 දිනැති මහා භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුගත වන පරිදි ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව

(උ) ආසියානු සංවර්ධන බැංකුවට පිළිගත හැකි ගිණුම්කරණ මූලධර්මවලට අනුව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තා පිළියෙල කර තිබුණේද යන බව

(ඌ) තැන්පත් ගිණුමේ ආරම්භක සහ අවසන් ශේෂයන්, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූර්ණයන් මහා භාණ්ඩාගාරය මගින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැං.) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන
---------------

2.1 මතය
-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නාවූ මතය වනුයේ,

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 150 සහ අංක 239/2014 හා 2014 දෙසැම්බර් 01 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට අනුකූල වන පරිදි 2013 අංක 36 දරන විසර්ජන පනතේ පළමු උපලේඛනයේ ශීර්ෂ අංක 126 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ 2014 වර්ෂයට අදාල විසර්ජන ගිණුම පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරන ලදි. ඉහත ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව, භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිත සටහන් සහ වාර්ෂික ඇස්තමේන්තු සහ අධ්‍යාපන අංශ මධ්‍යම ආයතන තුනෙහි ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සැසඳෙන බව,

(ආ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ තැන්පත් ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම්, මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත් පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ප්‍රතිපූර්ණ සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණව විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

2.2.1 වැඩසටහනේ අරමුණුවලින් බැහැරව අරමුදල් උපයෝජනය කිරීම.

---------------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩසටහනේ කටයුතු කරගෙනයාම සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෙන්කර තිබුණු මුදලින් රු.මිලියන 2.50 ක් වියපැහැදම් හා සම්බන්ධිත දර්ශකයෙන් ආවරණය නොකරනු ලබන ශ්‍රී ලංකා ගුරු සේවයේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථා පිළිබඳ දැනුවත් කිරීම සඳහා වූ පුවත්පත් දැන්වීම් පළ කිරීම සඳහා වැයකර තිබුණි.

(ආ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය සඳහා වූ තාක්ෂණ විෂය ධාරාව පිළිබඳ ජනතාව දැනුවත් කිරීම පෙළඹවීමට හා ඉගෙනීමට උනන්දු කරවීමත් යන කටයුතු හා සම්බන්ධිත වියපැහැදම් දර්ශකය යටතේ වෙන්කළ මුදලින් රු.මිලියන 13.8 ක පිරිවැයක් දරා "මහින්ද චින්තන ඉලක්ක සපුරා ගැනීම" යන නමින් වූ ප්‍රකාශනයකින් පිටපත් 100,000 ක් සමාලෝචිත වර්ෂයේදී මුද්‍රණය කර තිබුණි. එසේ වුවත්, දේශපාලනමය ප්‍රවර්ධන කරුණු ඇතුළත් ප්‍රකාශනයක් මගින් අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය සඳහා තාක්ෂණ විෂය ධාරාව ඉගෙනීමට සිසුන් හා දෙමාපියන් පෙළඹවීමක් හෝ දිරිගැන්වීමක් ඇති කිරීමට අදාළ කරගත නොහැකි වේ. තවද විනිවිදභාවයකින් යුතුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් මුද්‍රණකරු තෝරාගෙන නොතිබුණි. අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා කාර්යසාධන සමාලෝචන අංශය මගින් ප්‍රකාශනයේ සියලුම පිටපත් සෘජුව ලබාගෙන තිබුණු අතර පොත් බෙදාහැරීම තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි එම අංශය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) තවද, ජාත්‍යන්තර පරිගණක නියමු බලපත්‍ර සහ ජාත්‍යන්තර තොරතුරු සන්නිවේදන තාක්ෂණ යන පාඨමාලා පැවැත්වීමේ දේශීය නියෝජිතයා වශයෙන් කටයුතු කරනු ලබන පෞද්ගලික අධ්‍යාපන ආයතන 2 ක කලාප තොරතුරු තාක්ෂණ සන්නිවේදන මධ්‍යස්ථාන 77 ක් ලියාපදිංචි කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 3.49 ක් ව්‍යාපෘතිය මගින් වැයකර තිබුණි. එසේ වුවත්, මෙම කාර්ය වැඩසටහනේ වියපැහැදම් හා සම්බන්ධිත දර්ශකයන්ට සෘජුව අදාළ නොවුණි. පරිගණක හා අදාළ උපාංග, මානව සම්පත් හා අනෙකුත් උපාංග නොවීම නිසා ලියාපදිංචි සහතික නිකුත් කිරීම හෝ පුහුණු පාඨමාලාවන් ආරම්භ කිරීම හෝ සිදුකර නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

3.1 අරමුදල් උපයෝජනය

------------------------

අරමුදල් මූලායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළදී සහ 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ ඇතැම් වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමට අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | අයවැය ඇස්තමේන්තුව මගින් සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කළ මුදල | අරමුදල් උපයෝජනය 2014 වර්ෂය තුළදී | | අරමුදල් උපයෝජනය 2014 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන |
| ප්‍රධාන නියෝජිතායතනය | 200 | 26,000 | 3,094 | 23.8 | 3,091 | 23.7 | 3,091 |
| | 200 | 26,000 | 3,094 | 23.8 | 3,091 | 23.7 | 3,091 |

වැඩසටහන යටතේ ලබාදීමට එකඟ වී තිබුණු ණය මුදලින් මහා භාණ්ඩාගාරය විසින් එ.ජ.ඩොලර් මිලියන 33.32 ක් ලබාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අග්‍රිම මුදල් ලෙස මුදා හැර තිබුණේ එ.ජ.ඩොලර් මිලියන 23.7 ක් පමණි.

### 3.2 භෞතික ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබාදී තිබුණු මුදල රු.මිලියන 2,791 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළදී මහින්දෝදය තාක්ෂණ විද්‍යාපීඨ 250 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 7,000 ක ඇස්තමේන්තු සකසා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී විද්‍යාපීඨ 2 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට අනෙකුත් විද්‍යාපීඨ 248 හි ඉදිකිරීම් කටයුතු අර්ධ වශයෙන් නිමකර තිබුණි. එසේ වුවත්, ලී බඩු, ජීව පද්ධති උපකරණ සහ යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණ උපකරණ රු.මිලියන 970.28 ක පිරිවැයක් දරා විද්‍යාපීඨ 250 සඳහාම ප්‍රසම්පාදනය කර තිබුණු අතර ගොඩනැගිලි ඉදිකිරීම්වල ප්‍රමාදය නිසා මෙම උපකරණවල වලංගු කාලය එම උපකරණ භාවිතා කිරීමට අරමුණුගත කාර්යයන් සඳහා යෙදවීමකින් තොරව ඉකුත් වෙමින් පැවතුණි.

(ආ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ධාරාව අළුතින් හඳුන්වා දී තිබුණු පාසල් 250 කින් පාසල් 13 ක තාක්ෂණ විෂය ධාරාව සඳහා එකම ශිෂ්‍යයෙකු හෝ නොවීම නිසා පංති ආරම්භ කර නොතිබුණි. තවද, පාසල් 152 ක තාක්ෂණ විෂය ධාරාව සඳහා ශිෂ්‍යයින් 1 ත් 9 ත් අතර ප්‍රමාණයකින් සමන්විත විය. අළුතින් හඳුන්වා දුන් තාක්ෂණ විෂය ධාරාව සඳහා සමස්ථ වශයෙන් ගුරුවරුන් 167 ක හිඟයක් පැවතුණි.